# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2010 අංක 8 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2010 අගෝස්තු මස 17 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2010 අගෝස්තු මස 20 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 5.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# 2010 අංක 8 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2010 අගෝස්තු මස 17 වැනි දින]

එල්.ඩී.—ඕ. 6/2006.

## වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2010 අංක 8 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

"431 වන අධිකාරයේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**2.** මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන (431 වන අධිකාරය වූ) වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥාපනතේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය යුතු බව.

7. (1) මේ පනත යටතේ කරනු ලැබිය යුතු යැයි නියමිත සියලු කාරණා සම්බන්ධයෙන් හෝ, නියෝග සෑදීමට බලය දෙනු ලැබ ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර එකී පළ කිරීමේ දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් පසු දිනයක සිට බලපැවැත්විය යුතු ය.

(3) සෑම නියෝගයක් ම, එසේ ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොවූ සෑම නියෝගයක් ම එය යටතේ කලින් කරනු ලැබූ කිසිවකට අගතියක් නොවන පරිද්දෙන් එකී අනනුමතයේ සිට අවලංගු වූ ලෙස සැලකිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් අවලංගු වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.".

PL 005041—3,390 (2010/07)

"ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තිය, ඒ උපවගන්තියේ "දායකයකු වන යම් තැනැත්තකුට (1) වන උපවගන්තියේ කිසිවක් අදාළ නොවිය යුතු ය." යන වචන වෙනුවට "දායකයකු වන යම් තැනැත්තකුට (1) වන උපවගන්තියේ සඳහන් කිසිවක් අදාළ නොවිය යුතු ය:

එසේ වුව ද, අදාළ දිනයේ දී හෝ ඉන්පසුව රාජ්‍ය සේවයට ඇතුළත් වූ (1) වන උපවගන්තිය යටතේ විශ්‍රාම යාමකට හෝ ඉවත් කිරීමකට පෙරාතුව වසර දහයක සේවාවක් සම්පූර්ණ කොට ඇති යම් රාජ්‍ය නිලධරයකු (1) වන උපවගන්තිය යටතේ වූ ප්‍රතිලාභවලට සුදුසුකම් ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.".

"ප්‍රධාන ප්‍රඥප්තියේ 27අ සහ 27ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, එකී වගන්තිය ප්‍රඥප්තියේ 27අ සහ 27ආ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය:—

"හදිසි නීති, නියෝග ආදිය යටතේ වරදක් සංස්ථාපනය වන්නා වූ ක්‍රියාවක් හේතුවෙන් මිය යන රාජ්‍ය නිලධරයන්ට විශ්‍රාම වැටුප් ගෙවීම.

27අ (1) අරමුදලට දායක වී ඇති යම් රාජ්‍ය නිලධරයකු, තත්කාලයේ බලපවත්නා යම් හදිසි නීති නියෝගයක් යටතේ වරදක් සංස්ථාපනය වන්නා වූ ක්‍රියාවක් හේතුවෙන් හෝ යම් ස්වාභාවික ආපදාවක් හේතුවෙන් ඔහු විශ්‍රාම ගැනීමේ වයසට එළඹීමට පෙරාතුව මිය යන අවස්ථාවක දී, මේ ආඥාපනතේ වෙනත් යම් විධිවිධානවල කුමක් සඳහන් වුව ද ඒ නිලධරයාගේ වැන්දඹුව හා අනත් දරුවන්—

(අ) ඔහු මිය ගිය අවස්ථාවේ දී ලබමින් සිටි වැටුප මත පදනම් ව මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක්, ඔහු මිය ගිය දින සිට, ඔහු ජීවත්ව සිටියේ නම් ඔහු ඔහුගේ විශ්‍රාම ගැනීමේ වයසට එළඹෙන දින තෙක් ලැබීමට හිමිකම් ලැබිය යුතු ය; සහ

(ආ) ඔහු ජීවත්ව සිටියේ නම් ඔහු විශ්‍රාම ගත යුතු වයස තෙක් ලැබීමට හිමිකම තිබූ සියලු වැටුප් වැඩිවීම් සහිත වූ සංශෝධිත වැටුප මත පදනම්ව, මේ ආඥාපනතේ විධිවිධානවලට

අනුකූලව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක්, ඔහු විශ්‍රාම ගැනීමේ වයසට එළඹිය යුතු දින සිට සහ ඉන් පසුව ලැබීමට හිමිකම ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී, විශ්‍රාම ගැනීමේ වයස යන්න අදාළ නිලධරයාගේ මරණය පිළිබඳ අවස්ථානුගත තත්ත්වයන් ද, ඔහුගේ සේවා කාලය ද, එක් එක් විශේෂ සිද්ධියට බලපාන වැදගත් වෙනත් විස්තර ද සැලකිල්ලට ගනිමින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කළ යුතු ය.

(3) රාජ්‍ය සේවයේ තාවකාලික හෝ අනියම් තනතුරක් දරන, පුරුෂයකු වන්නා වූ යම් තැනැත්තකු, සේවා කාලය තුළ දී හදිසි නීති නියෝග යටතේ වරදක් සංස්ථාපනය වන්නා වූ ක්‍රියාවක් හේතුවෙන් හෝ යම් ස්වාභාවික ආපදාවක් හේතුවෙන් ඔහුගේ ධුරයේ ස්ථිර වීමට පෙරාතුව මිය යන අවස්ථාවක දී, ඒ තැනැත්තා, මේ ආඥාපනතේ වෙනත් යම් විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ඔහු මිය ගිය දින සිට මේ ආඥාපනතේ 27 වන වගන්තියේ විධිවිධාන අදාළ වනු ලබන නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු අතර මේ ආඥාපනතේ වෙනත් යම් විධිවිධානවල කුමක් සඳහන් වුව ද ඒ තැනැත්තාගේ වැන්දඹුව සහ අනත් දරුවන්—

(අ) එකී මිය ගිය දින සිට, ඔහු ජීවත්ව සිටියේ නම් ඔහුට වයස අවුරුදු පනස් පහ එළඹෙන දින තෙක් කාලය තුළ, මිය යන විට ඔහු විසින් උපයමින් තිබූ ගෙවීම් මත පදනම්ව මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කළ විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ලැබිය යුතු ය;

(ආ) ඔහු ජීවත්ව සිටියේ නම් වයස අවුරුදු පනස්පහ වනතෙක් ලැබීමට හිමිකම් තිබූ සියලු වැටුප් වැඩි වීම් සහිත විශ්‍රාම වැටුපක් ඔහුට වයස

අවුරුදු පනස් පහ එළඹිය යුතු දින සිට සහ ඉන්පසු ලැබීමට හිමිකම ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වන යම් තැනැත්තකු ඔහු රාජ්‍ය සේවයට බැඳුනු දින සිට ආඥාපනත යටතේ දායකයකු වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා, මේ ආඥාපනතේ වෙනත් යම් විධිවිධානවල කුමක් සඳහන් වුව ද මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද නිලධරයන් සහ (3) වන උපවගන්තියේ සඳහන් කරන ලද තැනැත්තන් ඔවුන් මිය ගිය දින වන විට අරමුදලට අයවිය යුතු දායක මුදල් සම්පූර්ණ වශයෙන් ගෙවා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ කාර්යය සඳහා—

"හදිසි නීති නියෝග" යන්නෙන්, (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග කිසිවක් අදහස් වේ.

"ස්වාභාවික ආපදා" යන්නට 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනතේ ඒ සඳහා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ "ට" උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ නිලධරයකුගේ වැන්දඹුව සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම.

27ආ. 27 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද—

(අ) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ "ට" උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති; සහ

(ආ) වසර පහක සේවා කාලය සම්පූර්ණ කිරීම මත විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන,

නිලධරයකුගේ වැන්දඹුවක, ඒ නිලධරයාගේ අභාවයෙන් පසු, මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව විශ්‍රාම යන අවස්ථාවේ ඒ නිලධරයා විසින් උපයන ලද වැටුප මත පදනම් ව ගණනය කරන ලද විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ලැබිය යුතු ය. දායක මුදල් ප්‍රමාණය එකී නිලධරයා විසින් උපයන ලද වැටුප මත පදනම් ව ගණනය කළ යුතු අතර, අවුරුදු පහක සම්පූර්ණ කාලයක් සඳහා ඒ දායක මුදල් පොළිය සමග අරමුදලට ගෙවනු ලැබිය යුතු අතර, ඒ මත උපචිත දායක මුදල් පොළිය ද සමග ගෙවා ඇත්නම් මිස සහ එසේ ගෙවන තෙක්, මේ වගන්තිය යටතේ විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ "අවිවාහක ගැහැණු අනත් දරුවකු" යන වචන වෙනුවට "ගැහැණු අනත් දරුවකු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"වැන්දඹුවක නැවත විවාහ වීම සම්බන්ධයෙන් වූ විධිවිධාන.

34. (1) දායකයකුගේ වැන්දඹුවක, ඇය නැවත විවාහ වීමේ දී, ඒ දෙවන විවාහය වූ දිනට පසුව සිට විශ්‍රාම වැටුප ලෙස—

(අ) ඒ දෙවන විවාහය සිදුවන අවස්ථාවේ දී ඇය ලබමින් සිටි විශ්‍රාම වැටුපෙන් අර්ධයක්; හෝ

(ආ) විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම තිබුණ ද, සැබෑ වශයෙන් එය එතෙක් නොලැබ තිබූ විටෙක, ඒ දෙවන විවාහයට පෙරාතුව, වැන්දඹුවක ලෙස ඇගේ තත්ත්වයෙන් ඇයට ලැබීමට තිබූ මුදල් ප්‍රමාණයෙන් අර්ධයක්,

ලැබීමට හිමිකම ලැබිය යුතු ය.

(2) ඉහත (අ) හෝ (ආ) ඡේදවල නියමයන්ට අනුව වැන්දඹුවට ගෙවනු ලැබීමෙන් පසු, වැන්දඹුව ලබමින් සිටි විශ්‍රාම වැටුපේ ඉතිරි කොටස වැන්දඹුවගේ ප්‍රථම විවාහයේ දරුවන් වෙත ලැබිය යුතු ය.

(3) ඒ දෙවන විවාහයේ කලත්‍රයාත් අරමුදලේ දායකයකු වන අවස්ථාවේ දී සහ ඒ කලත්‍රයාගේ මරණින් පසු ඒ කලත්‍රයා විසින් අරමුදලට ගෙවන ලද දායක මුදල් සම්බන්ධයෙන් විශ්‍රාම වැටුපක් ලැබීමට ද ඒ වැන්දඹුව හිමිකම් ලබන අවස්ථාවක දී (1) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදවල නියමයන්ට අනුව විශ්‍රාම වැටුපක් ලෙස ඇය විසින් ලැබූ යම් මුදලක් ගෙවීම දෙවන විවාහයේ ඇගේ කලත්‍රයා මියගිය දින සිට බලපැවැත්වෙන පරිදි අවසන් කළ යුතු ය:

එසේ වුව ද, ඉහත විධිවිධාන සලසා ඇති පරිදි විශ්‍රාම වැටුපක් ගෙවීම අවසන් කරන ලද අවස්ථාවක දී, වැන්දඹුවගේ පළමු විවාහයේ දරුවන්හට, ඔවුන්ගේ මවගේ දෙවන විවාහයේ කලත්‍රයා මිය ගිය දින සිට, (2) වන උපවගන්තියට අනුව ඔවුන් ලබමින් සිටි කොටස් සහ එකී අවසන් කිරීමට පෙරාතුව (1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව තම මව ලබමින් සිටි යම් මුදලක් ද ලබා ගැනීමට හිමිකම තිබිය යුතු ය:

එසේ වුව ද, වැඩි දුරටත්, ඒ දෙවන විවාහය විසුරුවා හරින අවස්ථාවක දී, වැන්දඹුවට, (1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඇය ලැබූ අර්ධය විශ්‍රාම වැටුපක් ලෙස ලැබීමට හිමිකම් ලැබිය යුතු අතර, (2) වන උපවගන්තිය යටතේ දරුවන්ට ඇති හිමිකමේ වෙනසක් නොවන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තිය එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන්;

(2) එහි නැවත අංක යෙදූ (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:—

"(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, කල්පිත හෝ අනිවාර්ය විශ්‍රාම යාමේ දිනයට පෙරාතුව තනතුර අවලංගු කිරීම මත රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගෙන ඇති සහ අරමුදලට දායක වීම නතර කර ඇති යම් නිලධරයකු විසින් ඒ විශ්‍රාම ගැනීමේ දිනයට පසුව එකී නිලධරයා විසින් ගිවිස ගත් විවාහයක් සම්බන්ධයෙන්, ඔහු විශ්‍රාම ගිය දින සිට වයස අවුරුදු පනස්පහ එළඹෙන තෙක් අරමුදලට දායක මුදල් ගෙවීම දිගටම සිදුකරනු ලැබිය හැකි ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— (ප්‍රධාන ප්‍රඥප්තියේ 51අ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)

("අදාළ දිනයට හෝ ඉන්පසුව දායකයන් බවට පත්වන සහ විශ්‍රාම වැටුපක් නොමැතිව රාජ්‍ය සේවය හැර යන විවාහක රාජ්‍ය සේවකයන්ට අදාළ කරගත හැකි විශේෂ විධිවිධාන.)

51අ. (අ) අදාළ දිනයේ දී හෝ ඊට පසු දායකයකු වන්නා වූ; සහ

(ආ) අවිවාහකයකු නොවන්නා වූ,

යම් රජයේ නිලධරයකු රජයේ සේවයෙන් ඉවත් වන විටෙක, ඔහු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපකට සුදුසුකම් නොලබන්නේ නම්, ඔහුට ඔහු විසින් ගෙවන ලද මුළු දායක මුදල හෝ ඉන් කොටසක් හෝ ප්‍රදානය නොකළ යුතු ය. එනමුත්, ඔහු සේවයෙන් ඉවත් වීමට පෙරාතුව වූ";

එසේ වුව ද, ඔහු සේවයෙන් ඉවත් වීමට පෙරාතුව ඒ සේවයේ වසර දහයක් හෝ ඊට වැඩි කාලයක් සම්පූර්ණ කර ඇත්නම් ඔහුගේ මරණින් පසු ඔහුගේ වැන්දඹුව හා අනත් දරුවන් ඔහු විසින් ගෙවන ලද දායක මුදල්වල පදනම මත මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතු ය.

මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව මිය ගිය තැනැත්තන්ට ප්‍රධාන ප්‍රඥප්තියේ 27අ වගන්තිය අදාළ වීම.

**9.** (1) 27 අ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන, අරමුදලට දායකව සිටි සහ මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ඉහත කී (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන්කොට ඇති අවස්ථානුගත තත්ත්වයන් යටතේ මිය ගිය රාජ්‍ය නිලධරයකුගේ, වැන්දඹුවට සහ දරුවන්ට අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(2) 27අ වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, පුරුෂයකු වූ සහ රාජ්‍ය සේවයේ තාවකාලික හෝ අනියම් තනතුරක සේවය කරමින් සිට මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ඉහත කී (3) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන්කොට ඇති අවස්ථානුගත තත්ත්වයන් යටතේ, සේවයේ සිටිය දී මියගිය තැනැත්තකුගේ වැන්දඹුව සහ දරුවන්ට, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(3) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වන යම් තැනැත්තකු ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ, දායකයකු ලෙස සැලකිය යුතු ය.

(4) මේ වගන්තියේ (1) වන උපවගන්තිය සහ (2) වන උපවගන්තිය යටතේ විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් නිලධරයන් සහ (2) වන උපවගන්තියේ සඳහන් තැනැත්තන් අරමුදලට ගෙවිය යුතු සියලු දායක මුදල් ඒ එක් එක් තැනැත්තා මිය ගිය දින වන විට සම්පූර්ණ වශයෙන් ගෙවා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

හිමිකම් පෑම් අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඉදිරිපත් කළ යුතු බව.

**10.** මේ පනතේ 9 වන වගන්තියේ සඳහන් යම් නිලධරයකුගේ හෝ තැනැත්තකුගේ අවස්ථාවෝචිත පරිදි යම් වැන්දඹුවක හෝ දරුවකු හෝ දරුවන්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක දී හෝ ඊට පෙර, ඔවුන්ගේ හිමිකම් පෑම්, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලබන ආකෘතියක, එම අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

අතීතයට බලපෑම.

**11.** මේ පනතේ 6, 7 සහ 8 වන වගන්ති ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වනු ලැබූ දිනයේ සිට බලපැවැත්වෙන ලෙස සැලකිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**12.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.